රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 32/91 (III)

මගේ අංකය : ආ/9/4/2-29 විවිධ 11
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2008.01.10

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පලාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

<u>පලාත් පාලන ඡන්ද විමසීම්වලදී ජයග්‍රහණය කර එම ආයතනවල සභාපති, උපසභාපති සහ නාගරික මන්ත්‍රීවරුන් ලෙස තේරී පත් වූ දේශපාලන අයිතිවාසිකම් හිමි නිලධාරීන්</u>

1991.10.31 දිනැති අංක 32/91(1) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට වැඩිමනත් වශයෙනි.

02. පලාත් පාලන ආයතනවල සභාපති තනතුරට පත්ව ඇති දේශපාලන අයිතිවාසිකම් හිමි නිලධාරීන්ට පහත සඳහන් අනුග්‍රහ ලබාදිය යුතු යයි අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇත.

I. පලාත් පාලන ආයතනයේ රාජකාරී කටයුතුවල නිරතවීම සඳහා මසකට දින 07 ක් රාජකාරී නිවාඩු වශයෙන් ලබා දී නිලධාරියාට නිත්‍ය තනතුරෙහි සේවයේ යෙදීමට අවස්ථාව ලබාදීම.

II. ඉහත සඳහන් නිවාඩු ලබා ගැනීමට මනාපය පළ නොකරන නිලධාරීන් සඳහා වැටුප් රහිත නිවාඩු මත පලාත් පාලන ආයතනයේ රාජකාරී කටයුතු කිරීම සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 32/91(1) හි 03 ඡේදයේ විධිවිධාන තවදුරටත් ක්‍රියාත්මක කිරීම.

03. මෙම විධිවිධාන 2007.11.07 දින සිට ක්‍රියාත්මක වේ.

ඩී. දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය